# රාජ්‍යය

## I - කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. රාජ්‍යය පිළිබඳ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A. අනෙකුත් සියලුම සමාජ සංවිධාන අතුරෙන් ඉහළම සංවිධානය ලෙස සැලකෙන මානව ප්‍රජාව වේ.

B. ස්වාධිපත්‍යය බලය ලෙස හැඳින්වෙන උත්තරීතර අධිකාරී බලයේ පරම හිමිකරුවා වේ.

C. ජාතීන් අතර දේශපාලනයේ ප්‍රධාන රඟුම් කරුවා වේ.

D. එයටම අනන්‍ය වූ නිළ නාමයකින් සමන්විත වේ.

E. ආණ්ඩුවේ දේශපාලන හස්තය වේ.

01. A,B,C,D   02. B,C,D,E   03. A, B,D, E   04. A,C,D,E   05. A,B,C,E

02. ස්වාධිපත්‍ය පිළිබඳ නිවැරදි පිළිතුර තෝරන්න.

A. විශාල හා කුඩා රාජ්‍යය අතර පවතින අසමානතා පිළිගනී.

B. රාජ්‍යයේ උත්තරීතර බලය සංකේතවත් කරයි.

C. ගෝලීය කරණය නිසා අභියෝගයට ලක්වී නැත.

D. අවශ්‍ය වූ විටෙක පහසුවෙන් බෙදිය හැකිය.

E. රාජ්‍යත්වය සඳහා අවශ්‍ය කොන්දේසියක් නොවේ.

03. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

A. ලිබරල්වාදීහු රාජ්‍යය සමාජයේ අපක්ෂපාතී බේරුම් කරුවෙකු ලෙස දකිති.

B. ස්ත්‍රීවාදීහු රාජ්‍යය පුරුෂාධිපත්‍යය ආයතනයක් ලෙස සලකයි.

C. ෆැසිස්ට්වාදීහු රාජ්‍යය සමාජයට වඩා පහත් යැයි සලකයි.

D. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හු රාජ්‍යය සමාජයට වඩා උසස් යැයි සලකයි.

E. මාක්ස්වාදීහු රාජ්‍යය පාලක පන්තියේ මෙවලමක් ලෙස සලකති.

04. ජාතික රාජ්‍යය පිළිබඳ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A. සංස්කෘතික විවිධත්වය සහ දේශපාලන අසමගිකම ආරක්ෂා කරන්නා වූ රාජ්‍යය ක්‍රමය ලෙස පොදු පිළිගැනීමට ලක්ව ඇත.

B. පුරවැසි භාවය සහ ජාතිකත්වය සමග සම්බන්ධ දේශපාලන බැඳීම් සමඟ ගොඩනගා ඇති ස්වාධීන දේශපාලන සමාජය වේ.

C. බහු ජාතික අධිරාජ්‍යය ක්‍රමයට හා නාගරික රාජ්‍යය ක්‍රමයට එරෙහි විකල්පයක් ලෙස 16 වන සියවසේදී පැන නැගුන රාජ්‍යය ක්‍රමය වේ.

D. සෑම ජාතියකටම රාජ්‍යයක් සහ සමස්ථ ජාතියටම එක් රාජ්‍යයක් යන මූලධර්මය මත ගොඩනැගී ඇත.

E. අන්තර්ජාතික දේශපාලනයේ මූලික ඒකකය ලෙස පොදුවේ පිළිගනු ලැබේ.

01. A,B,C,D   02. B,C,D,E   03. A, B,D, E   04. A,C,D,E   05. A,B,C,E

05. පුරවැසිභාවය පිළිබඳ සාවද්‍යය ප්‍රකාශය තෝරන්න.

A. පුද්ගලයා හා රාජ්‍යය අතර පවතින සම්බන්ධතාව ප්‍රකාශ වන මාධ්‍යය වේ.

B. රාජ්‍යයයේ පූර්ණ සාමාජිකත්වයට හිමිකම් කීම සඳහා තිබිය යුතු මූලික පූර්ව අවශ්‍යතාව වේ.

C. රාජ්‍යයේ පූර්ණ සාමාජිකයන් ලෙස නොසලකන යටත් වැසියන්ට හා විදේශියකයන්ට  හිමි නොවේ.

D. සම්බන්ධ වන මූලික බැඳීමක් වන්නේ රාජ්‍යයේ පැවැත්ම උදෙසා අවශ්‍යවන සමහර යුතුකම් ඉටු කිරීමට පුරවැසියන්ට සිදු වීම ය.

E. හිමි අයට තම කැමැත්ත අනුව ඕනෑම අවස්ථාවක සියදිවි හානිකර ගැනීමේ අයිතිය සහ නිදහස ඇත.

06. ජාතික රාජ්‍යය ක්‍රමයේ ප්‍රධාන අංග ලක්ෂණ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

A. නීත්‍යානුකුල පදනම මත අධිකාරී බලය යොදවමින් නියෝග බලාත්මක කිරීමට ඇති හැකියාව.

B. උත්තරීතර හා අසහාය බලයේ ඒකාධිකාරී හිමිකම.

C. දෛනික වැඩකටයුතු කරගෙන යෑම සඳහා භාවිතයට ගැනෙන පරිපාලන යාන්ත්‍රණය.

D. පැවරී ඇති වැඩකටයුතු ඉටු කිරීමට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය පමණක් භාවිතයට ගැනීම.

E. නීතිය, සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම සඳහා පොලීසිය හා සන්නද්ධ හමුදාව පවත්වාගෙන යාම.

01. A,B,C,D 02. B,C,D,E 03. A, B,D, E 04. A,C,D,E 05. A,B,C,E

07. අවම රාජ්‍යය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ ඇතුලත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A. පුරවැසියන්ට තමන් හොඳ යැයි සිතන ආකාරයේ පෞද්ගලික ජීවිතයක් ගත කිරීමට අවශ්‍යය සමාජ පරිසරය පවත්වාගෙන යාම.

B. පෞද්ගලික දේපල ක්‍රමය හේතුවෙන් පැන නැගී ඇති සමාජ අසාධාරණත්වය තුරන් කිරීම සඳහා ක්‍රියා කිරීම.

C. ආර්ථික හා සමාජ කාර්යයන් මුලුමනින්ම පුද්ගලයින්ට හෝ පෞද්ගලික ව්‍යාපාර වලට අත්හැරීම.

D. රාත්‍රී මුරකරුවෙකුගේ තත්වයට රාජ්‍යයේ කාර්ය භාර්ය අවම කිරීම.

E. සීමිත විවෘත වෙළඳපොල ක්‍රමයක පැවැත්ම පිළිගැනීම.

01. A,B,C,D 02. B,C,D,E 03. A, B,D, E 04. A,C,D,E 05. A,B,C,E

08. රාජ්‍යයේ ආරම්භය පිළිබඳ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A. දේව වරම් වාදයට අනුව දෙයවින් වහන්සේගේ නිර්මාණයක් වේ.

B. සමාජ සම්මුති වාදයට අනුව සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් වේ.

C. ලිබරල්වාදයට අනුව පොදු යහපත උදෙසා මිනිසුන් විසින් කල නිර්මාණයක් වේ.

D. මාක්ස් වාදයට අනුව පෞද්ගලික දේපල ක්‍රමය පැන නැගීමේ ප්‍රතිඵලයක් වේ.

E. ෆැසිස්ට් වාදයට අනුව දිගු සමාජ විකාශණයක ප්‍රතිඵලයක් වේ.

01. A,B,C,D 02. B,C,D,E 03. A, B,D, E 04. A,C,D,E 05. A,B,C,E

09. නූතන න්‍යායන්ට අනුව නූතන රාජ්‍යය වල හැඩගැස්ම කෙරෙහි බලපා ඇති සාධක වන්නේ,

A. ත්‍රස්ථවාදය B. ඒකාබද්ධ කිරීම.

C. වෙන්වීම. D. ජාතික වාදය

F. පරිවර්ථනය

01. A,B,C,D 02. B,C,D,E 03. A, B,D, E 04. A,C,D,E 05. A,B,C,E

10. සමකාලීන ලෝකයේ රාජයය වල කාර්ය භාරය නිවැරදිව දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A. නීතියේ, සමාජ පර්යායේ හා දේපල වල භාරකාරිත්වය.

B. ආර්ථික පරිපාලනය හා මෙහෙය වීම.

C. සමාජගත තරුණයන්ගේ විලාසිතා පාලනය කිරීම.

D. සමාජයේ නීතිය හා සාමය පවත්වාගෙන යෑම.

E. යුද්ධය ප්‍රකාශ කිරීම හා යුද්ධ කිරීම.

01. A,B,C,D 02. B,C,D,E 03. A, B,D, E 04. A,C,D,E 05. A,B,C,E

11. රාජ්‍යය විකාශනය පිළිබඳ මාක්ස්වාදී න්‍යායයේ ඉදිරිපත් කර ඇති ඕනෑම අවදි දෙකක් නම් කරන්න.
12. නූතන භෞමික රාජ්‍යයයේ ප්‍රධාන අංග ලක්ෂණ දෙකක් ලියන්න.
13. සමාජවාදී රාජ්‍යය ක්‍රමය අත්හදා බලා ඇති රටවල් දෙකක් ලියන්න.
14. ස්වාධිපත්‍යයේ ප්‍රධාන පැතිකඩ දෙක ලියන්න.
15. වර්තමානයේ රාජ්‍යය හා පුරවැසියා අතර සම්බන්ධතාවයේ කැපී පෙනෙන ලක්ෂණ දෙක ලියන්න.
16. ස්ත්‍රී වාදී අදහස් ඉදිරිපත් කර ප්‍රදාන ගුරු කුල දෙකක් ලියන්න.
17. ග්‍රීක නාගරික රාජ්‍යයනට අනන්‍ය වූ අදහස් දෙකක් දක්නට ඇත. එය නම් කරන්න.
18. රාජ්‍යයයේ සම්ප්‍රදායික කාර්ය ක්ෂේත්‍ර දෙකක් ලියන්න.
19. රාජ්‍යයයේ උත්තරීතර භාවය පිළිබඳ ඇරිස්ටෝටල්ගේ සහ මැක්ස් වේබර්ගේ අදහස් දෙක ලියා දක්වන්න.
20. ගෝත්‍රික රාජ්‍යය වල ලක්ෂණ දෙකක් ලියන්න.

## II **කොටස**

01. ගෝලීයකරණය නූතන රාජ්‍යය කෙරෙහි කරඇති බලපෑම විස්තර කරන්න.

**පිළිතුරු ලිවීම සඳහා අත්වැල.**

❖ ගෝලීයකරණය හඳුන්වා දෙමින් එය ප්‍රචලිත යුගය පිළිබඳ හැඳින්වීම.

❖ ගෝලීයකරණය පිළිබඳ නිර්වචන.

''ජාත්‍යයන්තර කරණය හෙවත් රටවල් අතර අන්තර් සම්බන්ධතා වඩා තීව්‍ර වීම, ජාත්‍යන්තර හුවමාරුව වර්ධනය වීම, රටවල් අතර අන්තර් රැඳියාව වර්ධනය වීම ගෝලීය කරණය වේ. ''

- පෝල් හර්ස්ට් සහ ග්‍රැහැම් තොම්සන් -

''නිදහස්කරණය මුල්කර ගත් ජාත්‍යන්තර ආර්ථික ඒකාග්‍රතාව හෙවත් ජාත්‍යන්තර වෙළඳාම, ප්‍රාග්ධනය, මූල්‍යය, ආගමන විගමන යනාදිය සම්බන්ධයෙන් රාජ්‍යය විසින් පනවනු ලබන සීමාවන් අහෝසි කිරීම ගෝලීය කරණය වේ. '' - හැරල් සැන්ඩර් -

❖ ගෝලීයකරණය ආකාර 03 කට සිදුවේ.

01. ආර්ථික ගෝලීයකරණය

02. දේශපාලන ගෝලීයකරණය

03. සංස්කෘතික ගෝලීයකරණය

❖ අවම රාජ්‍යය සංකල්පය මඟින් ගෝලීයකරණයට ගැලපෙන පරිදි රාජ්‍යයේ භූමිකාව සකස් කිරීම. එනම් මෙයට අනුව රාජ්‍යයේ කාර්ය භාරය,

01. භාහිර ආරක්ෂාව සැලසීම.

02. අභ්‍යන්තර සාමය හා කළමණාකරණය

❖ ආර්ථික, තාක්ෂණික, සංස්කෘතික කටයුතු රාජ්‍යය පාලනයෙන් බැහැර පරිභාහිර බලවේගයන් මගින් ගෝලීය ලෙස හසුරවයි.

❖ ගෝලීයකරණය මගින් අන්තර් ජාතික රාජ්‍යය කෙරෙහි කරන බලපෑම් පිළිබඳ ප්‍රධාන මතවාද දෙකකි.

01. ගෝලීයකරණය තුල ජාතික රාජ්‍යය අවසන් වන බව.

02. ගෝලීයකරණය තුල ජාතික රාජ්‍යය දුර්වල වන බව.

- ❖ නිගමනය.

02. රාජ්‍යය පිළිබඳ සමාජ සම්මුතිවාදී අදහස පිළිබඳ විග්‍රහයක් කරන්න.

- ❖ ධනවාදී ආර්ථික ක්‍රමය වර්ධනය වීමත් සමඟ රදල ආධිපත්‍යය බිඳ දැමීම සඳහා නව ධනපති පංතිය විසින් බිහිකළ මතවාදයයි.
- ❖ ඒ අනුව මෙතෙක් රාජ්‍යයට දිව්‍යමය උපතක් තිබේය යන්න පැවසූ දේව වරම් වාදය බිඳ හෙළමින් රාජ්‍යයට සමාජ මය උපතක් පැවතියා යැයි ගෙනආ මතවාදය සමාජ සම්මුති වාදයයි.
- ❖ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය ප්‍රථම වතාවට ඉස්මතු වූයේ සමාජ සම්මුතිවාදය ඇසුරිනි.
- ❖ ඉදිරිපත් කල චින්තකයන්,

01. තෝමස් හොබ්ස් (ඉංග්‍රීසි ජාතික)

02. ජෝන් ලොක් (ඉංග්‍රීසි ජාතික)

03. ෂෝන් ෂාක් රූසෝ (ප්‍රංශ ජාතික)

- ❖ දේශපාලන අරමුණ වූයේ රදල වැඩවසම් වාදය අහෝසි කර දමා ධනේෂ්වර ක්‍රමය ඉස්ථාපිත කිරීමයි.
- ❖ චින්තකයන් තිදෙනාගේ අරමුණු.

01. තෝමස් හොබ්ස් (ඉංග්‍රීසි ජාතික)

ලෙවියතාන් - 1651

අසහාය බලැති රාජ ආණ්ඩුවක් සාධාරණීකරණය කිරීම.

02. ජෝන් ලොක් (ඉංග්‍රීසි ජාතික)

සිවිල් ආණ්ඩුව පිළිබඳ සම්මුතීන් දෙකක් - 1690

ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුක්‍රමය සාධරණීකරණය  කිරීම. (පාර්ලිමේන්තුවට යටත් රාජ්‍යත්වය)

03. ෂෝන් ෂාක් රූසෝ (ප්‍රංශ ජාතික)

සමාජ සම්මුතිය - 1776

රාජ්‍යය බලය මහජනතාව වෙත පවරා දීම.

- ❖ ස්වභාවික සමාජය පිළිබඳ මතය.

01. අතිශය කලහකාරි ප්‍රබලයා විසින් දුබලයා යටපත් කරන යුක්තිය නොව ශක්තිය ජයගන්නා තත්වයක්.

- තෝමස් හොබ්ස්-

02.  ස්වභාවධර්මානුකූල නීතිය ක්‍රියාත්මක විය. ස්වභාවිකව අයිතිවාසිකම්  හිමිව තිබේ. නමුත් ජනග්‍රහනය අධික වීමත් සමඟ දේපල මුලකරගෙන ගැටුම් ඇති විය.

- ජෝන් ලොක් -

03. සරල කෘෂිකාර්මික දිවි පෙවෙතක් ගත කරමින් ප්‍රීතිමත් දිවියක් ගත කරන ලදී. විද්‍යාව හා තාක්‍ෂණයේ දියුණුව මත කෘෂිකාර්මික සමාජය සංකීරණ කාර්මික සමාජයක් බවට පත්වීම සමඟ ගැටුම් ඇති විය.

- ෂෝන් ෂාක් රූසෝ -

- ❖ සමාජ සම්මුතිවාදයේ වැදගත්කම්,
  - නව සමාජ වර්ධනයක් සඳහා දැක්වූ දායකත්වය.
  - නූතන ප්‍රජතන්ත්‍රවාදයේ වර්ධනය සඳහා දැක්වූ දායකත්වය.
  - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රභවය.
  - ධනවාදී ආර්ථික ක්‍රමය වර්ධය වීම.
- ❖ සමාජ සම්මුතිවාදයේ දූර්වලතා.
  - මනෝමූලික ප්‍රභන්ධයක් වීම. (මේ පිළිබඳ ඓතිහාසික සාක්ෂි නොමැත.)
  - ඉදිරිපත් කළ චින්තකයන්ගේ අරමුණු වල ප්‍රතිවිරුද්ධ භාවය.
  - නූතන මනෝ විද්‍යාඥයින්ට අනුව මිනිසා යහපත් හෝ අයහපත් ලෙස වර්ග කළ නොහැකිය. මිනිස් තුල මෙම ලක්ෂණ දෙකම මිශ්‍රව පවතී.
  - ඒකපාර්ශවීය සම්මුතීන් නැත.